# තානාපති කාර්යාලයීය ජංගම සේවා - මූලික උපදෙස් මාලාව

**තානාපති කාර්යාලයේ ජංගම සේවා පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීමේදී**
**පහත සඳහන් කාරණා පිළිබඳ සලකා බලනු ලැබේ.**

1 ජංගම සේවාව පැවැත්වීමට අපේක්ෂිත දිනය හා ස්ථානය
2 සෝල් නගරයේ සිට ඇති දුර ප්‍රමාණය
3 සේවා කටයුතු සඳහා පැමිණීමට අපේක්ෂිත සංඛ්‍යාව(100කට ආසන්න සේවාලාභීන් පිරිසක් සිටිය යුතුය.)
4 ඉල්ලුම් කරන ස්ථානයේ හෝ ඒ ආසන්නයේ අවසාන වරට ජංගම සේවාවක් පැවැත්වූ දිනය සහ ඊට සහභාගී වූ සංඛ්‍යාව
5 ජංගම සේවා කාර්ය මණ්ඩලයට අවශ්‍ය පහසුකම් ලබා දීමට ඇති හැකියාව
6 ජංගම සේවා සඳහා නිකුත් කර ඇති මූලික උපදෙස් මාලාව පිළිපැදීමට සූදානම් ද යන වග

- **තානාපති කාර්යාලයීය ජංගම සේවා සඳහා ඉල්ලුම් කළ හැක්කේ මේ සමඟ අමුණා ඇති අයදුම් පත්‍රය නිසි පරිදි පුරවා එවීමෙන් පමණක් වන අතර වෙනත් ලිපි හෝ ඊමේල් පණිවිඩ ඒ සඳහා බාරගනු නොලැබේ.**

- අයදුම්පතක් තානාපති කාර්යාලය වෙත යොමුකිරීම ජංගම සේවාවක් පැවැත්වීමට අවසර ලැබීමක් ලෙස **නොසැලකිය යුතුය**. **එබැවින්, තානාපති කාර්යාලයේ නිසි අවසරය සංවිධායක වෙත ලැබෙන තෙක් ජංගම සේවාව පිළිබඳ ප්‍රචාරක කටයුතු සිදු කිරීමෙන් වැළකිය යුතු වේ.**

- කිසියම් ප්‍රදේශයක තානාපති කාර්යාලයීය ජංගම සේවාවක් පැවැත්වීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව සලකා බැලීමට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට සහ ප්‍රතිපාදන වෙන්කර ගැනීමට අවශ්‍ය හෙයින් අයදුම්පත් බාරගනු ලබන අවසන් දිනට පසුව ඉදිරිපත් වන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

- ජංගම සේවා පවත්වනුයේ **ඉරිදා දිනවල සහ තානාපති කාර්යාලය විසින් ප්‍රකාශිත නිවාඩු දිනවල පමණි**.

- **සංගීත සංදර්ශනවලට අදාළව ජංගම සේවා පැවැත්වීමට ලැබෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ**.

- රාජකාරී කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට හැකිවන පරිදි ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහ අව් වැසි ආවරණ සහිත ස්ථානයක් පිළියෙළ කළ යුතුය.

- තානාපති කාර්යාලයීය ජංගම සේවාවට සමගාමීව වෙනත් කුමන හෝ වැඩසටහනක් සංවිධානය කරන්නේනම්, සේවය ලබාගැනීමට පැමිණෙන සේවාලාභීන්ට කිසිදු බාධාවක් නොවන පරිදි එම වැඩසටහන් සංවිධානය කළ යුතුය.

- **අයදුම්පත් බාරගනු ලබන අවසාන දිනය 2020 ජනවාරි මස 30 වැනිදායින් අවසන් වේ.**

- මෙම උපදෙස් මාලාව නිසි ලෙස කියවා අවබෝධ කරගෙන සාර්ථක ජංගම සේවාවක් ලබාදීමට තානාපති කාර්යාලයීය කාර්ය මණ්ඩලයට සහයෝගය ලබාදෙනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

**වැඩිදුර තොරතුරු සඳහා :**


දුරකථන : **02-735-2966/2967, 02-794-2968 - දිගුව 201 / 203**
ෆැක්ස් : **02-737-9577**
ඊමේල් : **slemb.seoul@mfa.gov.lk /cons.head@slembkr.org**
වෙබ් අඩවිය : **www. slembassykorea.com**

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
සෝල්, දකුණු කොරියාව